පාසැල් නිමවී උපකාරක පංති යමින් සිටි හොරොව්පතානේ බාලවයස්කාර සිසුවියක ලිංගික අපයෝජනයකට ලක් කිරීමේ සිදුවීමක් සහ, රාගම ප්‍රදේශයේ බාලවයස්කාර දැරියක් ලිංගික අපයෝජනයට ලක් කිරීමේ සිදුවීමක් සම්බන්ධ පුවත් දෙකක්, මාධ්‍ය තුළ අවධානයට යොමු වී තිබිණි. එහිදී පුවත්පත් දෙකක්, එම සිදුවීම් දෙක වාර්තා කර තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.

අද (සැප්, 08, 2022) - "17 හැවිරිදි දැරිය අපයෝජනය කළැයි පුංචි අම්මාගේ පෙම්වතා දැලේ" (පුවත් වාර්තාව තුළ ද සිදුවීම බරපතළ ලිංගික අපයෝජනයක් ලෙසින් දක්වා ඇත.)

දිනමිණ (සැප්, 08, 2022) - "ටියුෂන් ගොස් එන දැරිය කැලයට ඇදගෙන ගිහින්" (පුවත් වාර්තාව තුළ සිදුවීම දූෂණයක් ලෙසින් දක්වා ඇත.)

ලිංගික අපරාධයකට/අපයෝජනයකට ලක් වූ අයෙකු අපවිත්‍ර වී ඇති බවට අදහසක් ජනිත කරනා "දූෂණය" වැනි යෙදුම් වෙනුවට, ලිංගික අපරාධය/ලිංගික අපයෝජනය යන යෙදුම් වඩාත් යෝග්‍ය නොවන්නේ ද, ඒ ඔස්සේ, ලිංගික අපයෝජනයට ලක් වූ අයෙකුගේ ගරුත්වය ද ආරක්ෂා නොවනු ඇතිද යන පැනයන්, මින් පෙරද Ethics Eye අපි පාඨක ඔබෙන් අසා ඇත්තෙමු,

ඒ අනුව, වඩාත් යෝග්‍ය යැයි ඔබ තෝරාගන්නේ මින් කුමන පුවත් වාර්තාව ද?

"දූෂණය" වෙනුවට ලිංගික අපරාධය/ලිංගික අපයෝජනය වැනි වඩාත් යෝග්‍ය යෙදුම් භාවිතා කරමු!